155.4 S63

# පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසුන් මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය.

(මාතර දිස්ත්‍රික්කයේ මුලටියන අධ්‍යාපන කලාපය ඇසුරෙන්)

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපනපති උපාධි නිබන්ධය.

OPEN UNIVERSITY
66970

තෙලිකඩ පල්ලිය ගුරුගේ චමිලා ශ්‍රීමතී.
B.A (HONOURS), PGDE (OUSL)
50407860
2007 ජූලි.

66970

# සංක්ෂිප්තය.

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධයක් සඳහා වේ.

පසුවන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසුන් මුහුණ පාන ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය යොමු වී ඇත.පස්වන ශ්‍රේණියේ සිසුන් මුහුණ දෙන ගැටලු අවබෝධ කරගැනීමටත් එම ගැටලු අවම කර ගැනීම සඳහා සිසුන් නිරන්තරයෙන් ම රැඳී සිටින පාසල හා පවුල් පරිසරය තුළින් ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගෙන ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණු අතර විය.

මෙලෙසින් කරන්නට යෙදුණු අධ්‍යයනය සඳහා සාහිත්‍ය විමර්ශනයක් සිදුකරන ලදී. මේ තුළින් පස්වන ශ්‍රේණියේ සිසුන් පිළිබඳ ව ඉදිරිපත්ව ඇති මනෝ විද්‍යාත්මක අදහස්, පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ඉතිහාසය මෙන්ම විකාශනය ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව විවිධ පුද්ගලයන් විසින් සිදු කර ඇති අදහස්, ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව ඉදිරිපත්ව ඇති විවේචන, සමාජ ආර්ථික පරිසරය සිසුවා කෙරෙහි බලපාන ආකාරය මෙන්ම ශිෂ්‍යත්ව විභාගය කෙරෙහි මෙතෙක් ඉදිරිපත්වී ඇති නව යෝජනා පිළිබඳව සාහිත්‍ය විමර්ශනය තුළින් ඉදිරිපත් කෙරේ.

මෙම අධ්‍යයනය පස්වන ශ්‍රේණියේ සිසුන් ඉලක්ක කරගත් එකක් වන හෙයින් මේ සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. එමෙන්ම අධ්‍යයනය සඳහා වූ ඉලක්ක නියැදිය කණ්ඩායම් තුනකින් සමන්විත විය එනම්, පස්වන ශ්‍රේණියේ සිසුන්, එම සිසුන්ගේ දෙමාපියන් හා පස්වන ශ්‍රේණියේ උගන්වන ගුරු භවතුන්ය. මෙම නියැදීන් සඳහා සම්මුඛ සාකච්ඡා නියමාවලි භාවිතා කරමින් දත්ත රැස් කරගන්නා ලද අතර පර්යේෂණයේ සීමා ද සඳහන් වේ.

මෙලෙසින් සපයා ගන්නා ලද දත්ත තොරතුරු රැස් කරන ලද ප්‍රධාන තේමා ඔස්සේ ම ගෙන දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙලෙසින් සිසුන් , දෙමාපියන් හා ගුරුවරුන්ගෙන් ලබා ගත් තොරතුරු ප්‍රධාන තේමා වූ පාසල සම්බන්ධ තොරතුරු, නිවස සම්බන්ධ තොරතුරු, පාසල් කාලයට අමතර තොරතුරු, විනෝදාංශ හා ආකල්ප ඔස්සේ ම දත්ත අර්ථකථනයට ලක්කරන ලදී.

දත්ත අර්ථකථනයෙන් පසුව ඒ අනුසාරයෙන් නිගමන ඉදිරිපත් කෙරුණු අතර එම නිගමනයන් පදනම් කර ගනිමින් යෝජනාද ඉදිරිපත් කෙරේ. මෙම නිගමනද තොරතුරු රැස් කරනලද හා විශ්ලේෂණය කරන ලද තේමා ඔස්සේ ම ඉදිරිපත් කෙරෙන අතර යෝජනාද එම තේමා පාදක කර ගනිමින් ම ඉදිරිපත් කරන්නට යෙදුණි.

මෙලෙසින් සිදු කෙරුණු මෙම අධ්‍යයනය තුළින් පස්වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා සිසුන් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීම හේතුවෙන් මුහුණ පාන ගැටලුත්, එම ගැටලු ඇතිවීම කෙරෙහි පවුල හා පාසල නැමති සාධක බලපෑම් කරන ආකාරයත් එම ගැටලු අවම කර ගැනීම සඳහා  ගත යුතු ක්‍රියාමාර්ගත් ඉදිරිපත් වී ඇත.